# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1985 අංක 10 දරන
# පළාත් පාලන සේවා
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1985 මාර්තු මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1985 මාර්තු මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : රු. 1.20 යි. තැපැල් ගාස්තුව : ශත 60 යි.

**1985 අංක 10 දරන පළාත් පාලන සේවා (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1985 මාර්තු මස 27 වන දින]

**එල්. ඩී.—ඕ. 58/82.**

**ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**කෙටි නාමය.**

1. මේ පනත 1985 අංක 10 දරන පළාත් පාලන සේවා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.**

2. (මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ දීර්ඝ නාමය, එහි "පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයක් සහ පළාත් පාලන සේවා විනය මණ්ඩලයක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද එකී මණ්ඩලවල බලතල, කාර්ය හා කටයුතු නිශ්චය කිරීම සඳහා ද" යන වචන වෙනුවට, "පළාත් පාලන සේවා කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද එකී කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කටයුතු නිශ්චය කිරීම සඳහා ද" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය, එහි (2) වන උප වගන්තියේ "මහා නගර සභාවල, නගර සභාවල, සුළු නගර සභා වල සහ ගම් සභාවල" යන වචන වෙනුවට "මහා නගර සභාවල, නගර සභාවල සහ සංවර්ධන සභාවල" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ II වන කොටස ප්‍රතියෝජනය කිරීම.**

4. ප්‍රධාන ප්‍රඥප්තියේ II වන කොටස මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන කොටස මෙයින් ආදේශ කරනු ලැබේ :—

"II වන කොටස

පළාත් පාලන සේවා කොමිෂන් සභාව

පළාත් පාලන සේවා කොමිෂන් සභාව පිහිටුවීම.

3. (1) (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පළාත් පාලන සේවා කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබේ.

(2) කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් හෝ යම් සාමාජිකයකු විසින් නඩු පැවරීම ද සභාපතිවරයාට සහ සාමාජිකයන්ට විරුද්ධව යම් නඩු පවරනු ලැබීමක් ද කොමිෂන් සභාවේ නාමයෙන් කරනු ලැබිය යුතු ය.

ජ 082456—7,025 (85/02)

කොමිෂන් සභාවේ සංයුතිය.

4. (1) කොමිෂන් සභාව, සභාපතිවරයකුගෙන් ද තවත් සාමාජිකයන් හතර දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් ද සමන්විත වන්නේය. ඒ සියලු දෙනාම අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) යම් තැනැත්තෙක්—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වේ නම් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු බවට පත් වුවහොත් ;

(ආ) යම් පළාත් පාලන ආයතනයක සභිකයෙක් වේ නම් හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු බවට පත් වුවහොත්

ඒ තැනැත්තා, කොමිෂන් සභාවේ සභාපති හෝ සාමාජිකයකු හෝ වීමට නැතහොත් සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයෙකු ලෙස හෝ කටයුතු කර ගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

(3) සභාපතිවරයා හැර කොමිෂන් සභාවේ වෙනත් යම් සාමාජිකයකු, රෝගාතුරවීම නිසා හෝ අන් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ යම් කාලසීමාවක් තුළ තම ධුරයෙහි කාර්ය ඉටුකිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක, ඒ කාලසීමාව තුළ ඒ සාමාජිකයා වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් යම් තැනැත්තකු පත් කළ හැකි ය.

(4) සභාපතිවරයා රෝගාතුරවීම නිසා හෝ අන් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ යම් කාලසීමාවක් තුළ තම ධුරයෙහි කාර්ය ඉටුකිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක, ඒ කාලසීමාව තුළ ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ වෙනත් යම් සාමාජිකයකු පත් කළ හැකි ය.

(5) සභාපතිවරයා ද ඇතුළුව කොමිෂන් සභාවේ සාමාජිකයකු විසින්, තමා ධුරයෙන් ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින්, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(6) අමාත්‍යවරයා විසින් කිසි හේතුවක් නොදන්වා කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ වෙනත් යම් සාමාජිකයකු හෝ ඉවත් කළ හැකි අතර ඒ ඉවත් කිරීම කිසිම අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු ය.

(7) මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් ධුරය කලින් හිස් කළහොත් මිස, සභාපතිවරයා ද ඇතුළුව කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකුම අවුරුදු පහක කාලයක් ධුරය දැරිය යුතු ය :

එසේ වුවද ධුර කාලය ඉකුත් වීමට කලින් සභාපතිවරයා හෝ වෙනත් යම් සාමාජිකයකු හෝ ධුරය හිස් කළහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා, ඒ අනුප්‍රාප්තිකයා ද කලින් ධුරය හිස් කළහොත් මිස, ඔහු අනුප්‍රාප්ත වන්නේ යම් තැනැත්තකුගේ ධුරයකට ද ඒ තැනැත්තාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(8) කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ අනෙකුත් සාමාජිකයන්ට, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ කටයුතු.

5. (1) සභාපතිවරයා, කොමිෂන් සභාවේ සියළු රැස්වීම්වල මූලසුන දැරිය යුතු ය. කොමිෂන් සභාවේ යම් රැස්වීමකට සභාපති වරයා පැමිණ නොසිටිය හොත්, පැමිණ සිටින සාමාජිකයන් විසින්, තමන් අතුරෙන් කවර හෝ සාමාජිකයකු, ඒ රැස්වීමේ මූලසුන දැරීම සඳහා තෝරා පත්කර ගත යුතු ය.

(2) කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත විය යුතු අතර, කොමිෂන් සභාව විසින් එහි රැස්වීම් සම්බන්ධයෙන් සිය කාර්ය විධානය විධිමත් කර ගත හැකි ය.

(3) කොමිෂන් සභාවේ යම් රැස්වීමක දී තීරණයක් ගැනීමට ඇති සියලු ප්‍රශ්න, පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. පක්ෂව හා විපක්ෂව ලැබුණු ඡන්ද සංඛ්‍යාව සමාන වන අවස්ථාවක සභාපතිවරයාට හෝ මූලසුන දරන සාමාජිකයාට තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) කොමිෂන් සභාවේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක්, එහි සාමාජිකත්වයෙහි පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි සාමාජිකයකු පත් කිරීමෙහි ලා කිසියම් දෝෂයක් තිබීමේ හෝ හේතුවෙන් පමණක් නිර්බල නොවිය යුතු ය.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය.

5අ. (1) කොමිෂන් සභාවට ලේකම්වරයකු සිටිය යුතු ය. ලේකම්වරයා අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ අනෙකුත් නිලධරයන් සේවයෙන් හෝ ආණ්ඩුවේ ස්ථාන මාරු සහිත සේවයෙන් හෝ පත් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ III වන කොටස ඉවත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ III වන කොටස මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන කොටස III වන කොටස ලෙස නැවත අංක යෙදීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන කොටස එහි III වන කොටස ලෙස නැවත අංක යොදනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" අමාත්‍යවරයා විසින් ස්වකීය බලතල පැවරිය හැකි බව.

7. (1) අමාත්‍යවරයා විසින්, මේ පනත යටතේ වූ ස්වකීය බලතල සියල්ලම හෝ ඉන් යමක් හෝ කලින් කල, කොමිෂන් සභාව වෙත පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තමන් වෙත පවරා දෙනු ලැබූ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා කොමිෂන් සභාව විසින් කරන ලද යම් සේවයෙන් පහ කිරීමේ නියමයකින් හෝ විනය පිළිබඳ වූ වෙනත් යම් කාරණයක් සම්බන්ධ නියමයකින් හෝ අතෘප්තියට පත්, සේවයේ කවර හෝ සාමාජිකයකුට ඒ නියමයට විරුද්ධව අමාත්‍යවරයා වෙත එක් අභියාචනයක් කිරීමේ අයිතිය තිබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" අමාත්‍යවරයා විසින් ලිපිගොනු යනාදිය කැඳවිය හැකි බව.

8. කොමිෂන් සභාවේ කාර්ය ඉටුකිරීම සහ බලතල ක්‍රියාවේ යෙදවීම් සම්බන්ධයෙන් අමාත්‍යවරයාට අවශ්‍ය විය හැකි ලිපිගොනු, වෙනත් ලිපිලේඛන හෝ තොරතුරු සපයන ලෙස අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවට නියම කළ හැකි ය.".

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ප්‍රතිස්ථාපනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" කොමිෂන් සභාව විසින් ස්වකීය බලතල පවරා දිය හැකි බව.

9. (1) කොමිෂන් සභාව විසින් සේවයේ යම් ගණයක සාමාජිකයන් පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම හෝ ඔවුන්ගේ විනය පාලනය කිරීම සම්බන්ධයෙන් වූ ස්වකීය බලතල, අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව, කවර හෝ රජයේ නිලධරයකුට, පළාත් පාලන ආයතන ප්‍රධානයකුට හෝ සේවයේ යම් සාමාජිකයකුට පවරනු ලැබිය හැකි ය.

(2) කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ ස්වකීය බලතල කිසිවක් පවරා දෙනු ලැබූ කවර හෝ තැනැත්තකු විසින් කරන ලද සේවයෙන් පහ කිරීමේ නියමයකින් හෝ විනය කාරණයක් හා සම්බන්ධ වෙනත් යම් නියමයකින් අතෘප්තියට පත් සේවයේ කවර හෝ සාමාජිකයකුට, කොමිෂන් සභාව වෙත අභියාචනය කිරීමට අයිතිය තිබිය යුතු අතර එවැනි යම් අභියාචනයක් මත, ඒ නියමය වෙනස් කිරීමට, අමුතු කිරීමට හෝ පරිච්ඡින්න කිරීමට කොමිෂන් සභාවට බලය ඇත්තේ ය.".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" නියමය වෙනස් කිරීමට, අමුතු කිරීමට හෝ පරිච්ඡින්න කිරීමට අමාත්‍යවරයාට බලය ඇති බව.

10. අමාත්‍යවරයාට—

(අ) කාරණයට අදාළ සියලු කරුණු සැලකිල්ලට ගෙන, අභියාචනයක් මත හෝ අන්‍යාකාරයකින් කොමිෂන් සභාව විසින් කරන ලද සේවයෙන් පහ කිරීමේ නියමයක් හෝ විනය කාරණයක් හා සම්බන්ධ වෙනත් යම් නියමයක් ;

(ආ) අදාළ බඳවා ගැනීමේ පරිපාටිය සැලකිල්ලට ගෙන, කොමිෂන් සභාව විසින් 9 වන වගන්තිය යටතේ ස්වකීය බලතල පවරා දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් කරන ලද යම් පත් කිරීමක්

වෙනස් කිරීමට, අමුතු කිරීමට හෝ පරිච්ඡින්න කිරීමට බලය ඇත්තේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන, 12 වන සහ 12අ වන වගන්ති ඉවත් කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11, 12 සහ 12අ වන වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ V වන කොටස එහි IV වන කොටස ලෙස නැවත අංක යෙදීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ V වන කොටස, ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන කොටස ලෙස මෙයින් නැවත අංක යොදනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (1) මේ පනත යටතේ තමා වෙත නියම කරනු ලැබූ හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයක් මගින් අමාත්‍යවරයා විසින් තමා වෙත පවරනු ලැබූ හෝ භාර දෙනු ලැබූ යම් කාර්යයක් හෝ කටයුත්තක් ඉටු කිරීමට, පළාත් පාලන සේවා අධ්‍යක්ෂ වශයෙන් හෝ පළාත් පාලන සේවා අධ්‍යක්ෂ ලෙස කටයුතු කිරීමට හෝ තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 16අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**14.** මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය, ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියට ඉක්බිතිව ම ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 16අ වන වගන්තිය ලෙස බලපවත්වන්නේ ය.

" වැන්දඹු පුරුෂ හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලක් පිහිටුවීම.

16අ. (1) සේවයේ විශ්‍රාම වැටුප් සහිත සාමාජිකයන්ගේ වැන්දඹු පුරුෂයන්ට සහ අනත් දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා, පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ සහ අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලබන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලබන අරමුදල, පළාත් පාලන සේවා අධ්‍යක්ෂවරයා විසින් හෝ තත් කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන වෙනත් රාජ්‍ය නිලධරයකු විසින් හෝ පාලනය කරනු ලබන්නේ ය".

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය, "වෙන යම් රාජ්‍ය නිලධරයකු" යන වචන වෙනුවට "යම් රාජ්‍ය නිලධරයකු" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

16. මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය, ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියට ඉක්බිතිව ම ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 19අ වන වගන්තිය ලෙස බලපවත් වන්නේ ය:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 19අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"අමාත්‍යවරයා විසින් විධාන දිය යුතු බව.

19අ. (1) යම් නීතියක් යටතේ පළාත් පාලන ආයතනයක් විසින් කළ යුතු හෝ ඉටු කළ යුතු වැඩ හෝ සේවාවන් සැලකිල්ලට ගන්නා විට, අවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් සලකනු ලැබිය හැකි යම් තනතුරක් හෝ තනතුරු ඇති කරන ලෙස එවැනි පළාත් පාලන ආයතනයකට විධාන කිරීමට අමාත්‍යවරයාට බලය ඇත්තේ ය.

(2) සෑම පළාත් පාලන ආයතනයක් විසින් ම අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ කරන ලද විධානයන් අනුව වහාම කටයුතු කළ යුතු ය.".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය, එහි එන "පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල හෝ පළාත් පාලන සේවා වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල හෝ පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදල" යන වචන වෙනුවට "පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල හෝ පළාත් පාලන සේවා වැන්දඹු සහ අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදල හෝ පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල හෝ පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදල" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය 20අ වගන්තිය ලෙස බලපැවැත්වේ—

ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"සේවයේ සාමාජිකයන් යම් රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක කාර්ය මණ්ඩලයට පත් කිරීම.

20අ. (1) යම් රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක ඉල්ලීම පිට සේවයේ කවර හෝ සාමාජිකයකු අවස්ථාවෝචිත පරිදි ඒ රජයේ දෙපාර්තමේන්තුවේ, සංස්ථාවේ හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ඒ රජයේ දෙපාර්තමේන්තුව, සංස්ථාව හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවකට තාවකාලිකව පත් කරනු ලැබීමේ කාර්යය සඳහා ඒ සාමාජිකයාගේ සහ කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව ඒ සේවයෙන් මුදා හරිනු ලැබිය හැකි ය. නැතහොත් ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කිරීමේ කාර්යය සඳහා මුදා හරිනු ලැබිය හැකි ය.

(2) සේවයේ කවර හෝ සාමාජිකයකු යම් රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක සහ ඒ තාවකාලික පත් කිරීම කරනු ලැබූ අවස්ථාවේ දී සේවයේ ඔහුගේ ස්ථිර තනතුර, 1975 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් නියෝගවල 3 වන නියෝගයට අනුකූලව විශ්‍රාම වැටුප් සහිත තනතුරක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබූ තනතුරක් වූයේ නම්, ඔහු ඒ රජයේ දෙපාර්තමේන්තුවේ, සංස්ථාවේ හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයේ සේවයේ නියුක්තව සිටි සෑම සම්පූර්ණ මාසයක් සඳහා ම, සේවයේ ඔහුගේ ස්ථිර තනතුරෙහි ඔහුට ගෙවනු ලැබිය යුතු වැටුපෙන් සියයට විසිපහක් නොඉක්මවන්නා වූ ද පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැක්කා වූ ද යම් මුදල් ප්‍රමාණයක් පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට බැර කිරීම සඳහා ඒ රජයේ දෙපාර්තමේන්තුව, සංස්ථාව හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලය විසින් පළාත් පාලන සේවා අධ්‍යක්ෂවරයාට ගෙවිය යුතු ය.

(3) සේවයේ යම් සාමාජිකයකු රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවේ දී 17 වන වගන්තිය මගින් පිහිටුවනු ලැබූ පළාත් පාලන සේවා අර්ථ සාධක අරමුදලට දායකයකුව සිටියේ නම්, ඒ රජයේ දෙපාර්තමේන්තුවෙහි, සංස්ථාවෙහි හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයෙහි ඔහුගේ සේවය, මේ පනතේ කාර්ය සඳහා පළාත් පාලන සේවයෙහි කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව, ඔහු මේ පනත යටතේ ගෙවීමට යටත්වන දායක මුදල, ඒ රජයේ දෙපාර්තමේන්තුවෙහි, සංස්ථාවෙහි හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයෙහි සේවයේ නියුක්තව සිටින කාලය තුළ දී, පළාත් පාලන සේවා අර්ථ සාධක අරමුදලට ගෙවිය යුතු ය; තව ද ඒ සාමාජිකයා ඒ රජයේ දෙපාර්තමේන්තුවේ, සංස්ථාවේ හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව හෝ පත් නොකරන ලද නම්, පළාත් පාලන සේවා අර්ථ සාධක අරමුදලට, අදාළ පළාත් පාලන ආයතනය විසින් ගෙවිය යුතු විය හැකිව තිබුණු දායක මුදලට සමාන මුදල් ප්‍රමාණයක්, එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී, පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදලට බැර කරනු සඳහා ඒ රජයේ දෙපාර්ත

මේන්තුව, සංස්ථාව හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලය විසින්, ඔහු වෙනුවෙන්, පළාත් පාලන සේවා අධ්‍යක්ෂවරයාට ගෙවිය යුතු ය.

(4) සේවයේ යම් සාමාජිකයකු, යම් රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවේ දී, 17 වන වගන්තිය මගින් පිහිටුවනු ලැබූ පළාත් පාලන සේවා අර්ථ සාධක අරමුදලේ දායකයකුව සිටි අවස්ථාවක, ඔහු සේවයේ සිය තනතුර අත්හැර දමනු ලැබූ සේ සැලකිය යුතු ය.".

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (2) වන උප වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) 15 වන, 16 වන, 16අ වන සහ 17 වන වගන්තිවල සඳහන් එක් එක් අරමුදල පරිපාලනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම ;";

සහ,

(2) ඒ උපවගන්තියේ (ඇ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) 16 වන වගන්තිය යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු සහ අනාත්දරු විශ්‍රාම වැටුප් අරමුදල යටතේ විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම සඳහා සහ 16අ වන වගන්තිය යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ සහ අනාත්දරු විශ්‍රාම වැටුප් අරමුදල යටතේ විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම සඳහා සේවයේ සාමාජිකයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් සහ දරුවන් සුදුසුකම් ලබන්නේ කවර කොන්දේසි, කරුණු සහ සීමාකිරීම් යටතේද, ඒ කොන්දේසි, කරුණු සහ සීමාකිරීම් ද ඒ අරමුදල පරිපාලනය කරන අධිකාරිය විසින් සහ සේවයේ සාමාජිකයන් විසින් ඒ අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නියම කිරීම ද ඒ අරමුදලින්, ඒ වැන්දඹුවන්ට, වැන්දඹු පුරුෂයන්ට සහ දරුවන්ට කළ යුතු ගෙවීම් ද, ඒ සාමාජිකයන්ගේ වැටුප්වලින් ඔවුන්ගේ ආයකමුදල් අඩු කර ගැනීමට බලයදීම සහ ඒ අඩු කිරීම් කිරීම සඳහා වූ ක්‍රියා පිළිවෙල ද ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය, " පළාත් පාලන ආයතනය " යන්නෙහි අර්ථ කථනය වෙනුවට මෙහි පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" පළාත් පාලන ආයතනය " යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක් හෝ සංවර්ධන සභාවක් අදහස් වේ. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) උපලේඛනයේ 2, 3 සහ 4 දරන විෂයයන් ඉවත් කිරීමෙන් ;

(ආ) උපලේඛනයේ අංක 1 දරන විෂයයට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන අලුත් විෂයය ඇතුළත් කිරීමෙන්—

"2. 1980 අංක 35 දරන සංවර්ධන සභා පනතින් පිහිටුවන ලද දිස්ත්‍රික් සේවාවෙහි තනතුරක් වන්නා වූ ද ඒ තනතුරට පවරා ඇති උපරිම වැටුප ඒ පනතේ 36 වන වගන්තියේ (2) වන උපවගන්තියේ කාර්ය සඳහා නියම කර ඇති මුදල් ප්‍රමාණය නොඉක්මවන්නා වූ ද කවර හෝ තනතුරක්.".

අන්තර්කාලීන විධිවිධාන.

**22.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම දිනයෙහි ධුරය දරන පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ සහ පළාත් පාලන සේවා විනය මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට ඒ ධුර දැරීම අවසන් කළ යුතු ය.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය සහ පළාත් පාලන සේවා විනය මණ්ඩලය ගැන කරනු ලබන සෑම සඳහන් කිරීමක් ම, මේ පනත යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා කොමිෂන් සභාව ගැන කරන ලද සඳහන් කිරීමක් ලෙස කියවිය යුතු අතර එපරිද්දෙන් තේරුම් ගත යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.